www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රියෝ ටින්ටෝ විධායකයා අත්අඩංගුවට ගැනීම චීනයේ ගැඹුරු වන ආර්ථික අර්බුදය සනිටුහන් කරයි

## Arrest of Rio Tinto executive points to deepening economic crisis in China

ජෝන් චාන් විසිනි
2009 ජුලි 15

රියෝ ටින්ටෝ සමාගමේ චීන යපස් නිධි විධායක ස්ටර්න් හියු ජුලි 05 දින ෂැංහයිහි දී අත්අඩංගුවට ගැනීම මගින්, ඉහල නගින විරැකියාව හා අපනයන ඇනවුම් පහත වැටෙමින් ඇති තත්ත්වය තුල සිය ආර්ථික ප්‍රතිමල්ලවයන් පිලිබඳව චීන පාලන තන්ත්‍රය අනුගමනය කරන දැඩි පිලිවෙත ඇඟවුම් කරයි. එදින ම සින්ජියැන් හි හටගත් විරෝධතා මගින් සනිටුහන් කල පරිදි, සමාජ පිපිරීම් පිලිබඳ අන්තරායෙන් හටගත් භීතිය හමුවේ බීජිනය, සිය වානිජ්‍ය කටයුතු පවත්වාගෙන යාම ජාතික ආරක්ෂක කටයුතු වල මට්ටමට ම ඔසවා තිබේ.

චීනයේ උපත ලත් ඕස්ට්‍රේලියානු ජාතිකයෙක් වන ස්ටර්න් හියු සමග ඔහුගේ චීන සගයන් තිදෙනෙකුට සාමාන්‍යයෙන් රටතුල දේශපාලන විරුද්ධවාදීන් ඉලක්ක කිරීම සඳහා වෙන්කොට ඇති, රාජ්‍ය රහස් සොරාගැනීම පිලිබඳ චෝදනා එල්ල කොට ඇත. ඇන්ග්ලෝ - ඔස්ට්‍රේලියානු රියෝ ටින්ටෝ, ඕස්ට්‍රේලියානු බීඑච්පී බිලිටන් හා බ්‍රසිලියානු වැලේ යන සමාගම් ද ඇතුලු ගෝලීය පතල් කැනීමේ යෝධයන් සමග මේ වසරේ යපස් නිධි පිලිබඳ සාකච්ඡා කෙරෙන අතරතුර, තොරතුරු ලබාගැනීමේ අටියෙන් චීන වානේ සමාගම්වල නිලධාරීන්ට අල්ලස් දුන් බව පෙනී යන්නේ යයි, චීන රාජ්‍ය ආරක්ෂක ආයතනය ඔහුට විරුද්ධව චෝදනා එල්ල කොට ඇත.

චීන රහස් පොලීසිය සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇත්තේ තොරතුරු සුලු ප්‍රමානයක් වන අතර නිල වශයෙන් කිසිදු චෝදනාවක් ගොනුකර ඇත්තේ ද නැත. සත් වසරක සිර දඬුවම් නියමකල හැකි චීනයේ අපරාධ නීතියේ 282 වගන්තිය යටතේ හියුට විරුද්ධව නඩු පැවරිය හැකිය. ජුලි 14 දින චයිනා ඩේලි නිල පුවත්පතට අනුව, රියෝ හා අනෙකුත් අන්තර්ජාතික කැනීම් සමාගම්, ''මිල සාකච්ඡාවන්හි දී චීනයට අවාසිදායක වන පරිදි තොග තත්ත්වය, නිෂ්පාදන කාලසටහන් හා පරිමාව, මූල්‍ය තොරතුරු හා ගැනුම් සැලසුම් වැනි දේ පිලිබඳ තොරතුරු කරා පිවිසීම සඳහා, විධායකයන්ට අල්ලස් දී තිබිය හැකිය''

පුලුල් පරීක්ෂනයක් වනු ඇති බව පෙනීයන මෙම සිද්ධිය සම්බන්ධයෙන්, යපස් නිධි පිලිබඳ සාකච්ඡාවන්ට සහභාගී වූ චීන යකඩ හා වානේ සමායතනයේ නිලධාරීන් හා චීන වානේ විධායකයන් ගනනාවකගෙන් ප්‍රශ්න කොට තිබේ. විශාල වානේ සමාගමක් වන ෂෝ ගුආන් හි යපස් නිධි ප්‍රධානියා වන යැන් යික්සින් ජුලි 7 දින අත්අඩංගුවට ගෙන තිබේ. හියුගේ අත්අඩංගුවට ගැනීමට මුල් වූ පරීක්ෂනය සඳහා චීන ජනාධිපති හූ ජින්ටාවෝ විසින් පුද්ගලිකව ම අනුමැතිය දී ඇති බව ආන්ඩුවේ මූලාශ්‍ර උපුටා දක්වමින් සිඩ්නි මෝනිං හෙරල්ඩ් 13 දින වාර්තා කලේය.

සාමාජිකයන් 9 දෙනෙකුගෙන් සමන්විත බලගතු චීන කොමියුනිස්ට් පක්ෂයේ (සීසීපී) දේශපාලන බියුරෝවේ ක්‍රියාකාරී කමිටුව, අගමැති වෙන් ජියාබාවෝගේ නායකත්වයෙන් යුත් රාජ්‍ය කමිටුව වෙතින් ආර්ථික ප්‍රතිපත්ති පරිපාලනය තමන් වෙත පවරාගෙන ඇති බව පුවත්පත කියා සිටියි. කැන්බරාව සමග රාජ්‍යතාන්ත්‍රික ආතතීන් ගැඹුරු වෙද්දී, ස්ටර්න් හියු රඳවාගැනීමට ජනාධිපති හූ කෙලින්ම අතපොවා ඇති බවට පලවූ වාර්තා, 12 දින චීන විදේශ අමාත්‍යංශය විසින් ප්‍රතික්ෂේප කලේය.

පුවත්පත මෙසේ වාර්තා කරයි. ''චීන ආර්ථික ප්‍රතිපත්තිය ඉහල ජාතික ආරක්ෂක ප්‍රශ්නයක් කරා

ඔසවනු ලැබුවේ, පසුගිය වසර අවසාන භාගයේ ෂැංහයි හා ෂෙන්සෙන් කොටස් වෙලඳපොල බිඳවැටීමත් සමග හා දේපල වෙලඳපොල දුබලවීමත්, වෙරලබඩ කලාපයන්හි කාර්මික නිෂ්පාදන අපනයනයේ ගැටලුත් සමග ය. සැප්තැම්බරයෙන් පසුව මූල්‍ය අර්බුදය ගැඹුරුවීමත් සමග මෙම ක්‍රියාවලිය වේගවත් විය.''

පීකිං විශ්වවිද්‍යාලයේ කලමනාකරනය පිලිබඳ ගුවන්හුවා පාසැලේ මහාචාර්ය මයිකල් පෙටිස් හෙරල්ඩ් පත්‍රය සමග මෙසේ පවසා තිබුනි. ''ආර්ථිකය පිලිබඳව චීන නායකයින් අන් කවරෙකුටත් වඩා කනස්සල්ලට පත්ව ඇති බවක් මෙයින් පෙනී යන්නේය''

සාමාන්‍යයෙන් සෑම වසරක ම ජූනි 30 වන දින අවසන්වන යපස් නිධි මිල ගනන් පිලිබඳ සාකච්ඡා, මේ වසරේදී ප්‍රතිපලදායී නොවීය. ඊට හේතුව ජපානය, දකුනු කොරියාව හා තායිවානයේ ප්‍රධාන වානේ සංගතයන් සමග රියෝ ටින්ටෝ හා බීඑච්පී සමාගම් එකඟවූ සියයට 33 මිල අඩුකිරීමට වඩා සියයට 40-45 අතර මිල පහත හෙලීමක් චීන වානේ සමායතනය විසින් ඉල්ලා සිටීමයි. ලොව විශාලතම වානේ නිෂ්පාදකයාට, මීට පෙර නම් සිතාගැනීමටවත් නොහැකි, විවෘත වෙලඳපොලේ අස්ථායී සැපයුම හා අවිනිශ්චිත මිල ගනන් මත රැඳී සිටීමට චීන වානේ සංගතයන්ට සිදුව තිබේ.

ජුලි 8 දින චයිනා බිස්නස් නිව්ස් චීන වානේ සමාගම් වලට සියයට 33 මිල අඩුවීම පිලිගැනීමට සිදුවූ බව වාර්තා කල ද, බීඑච්පී හෝ රියෝ මෙම වාර්තා අනුමත කලේ නැත. පසුගිය වසරේදී චීනය යපස් මෙට්රික් ටොන් 444 ක් ආනයනය කලේය. මින් සියයට 70 ක් ම ලබාගත්තේ වැලේ, බීඑච්පී හා රියෝ සමාගම් වලිනි. ඒ දැවැන්ත පාඩු ලැබීමේ අවදානම සහිතව ය. චීන නිෂ්පාදන කර්මාන්තය විශ්වාසය තබා ඇත්තේ ලාභ ශ්‍රමය මෙන්ම ලාභ අමුද්‍රව්‍ය මතය. නිර්යාතයේ තියුනු වැටීමක කොන්දේසි යටතේ, දැවැන්ත ලෙස තව තවත් රැකියා අහිමිවීමේ ශක්‍යතා ගැන නොකීවත්, බොහෝ සමාගම් වලට නිමැවුම් මිල, ජීවිතයත් මරනයත් අතර ප්‍රශ්නයකි. සැප්තැම්බරයේ පටන් දැනටමත් චීන කම්කරුවන් මිලියන 20 කට අධික සංඛ්‍යාවකට රැකියා අහිමි වී ඇත.

14 දින චයිනා ඩේලි පත්‍රය වාර්තා කලේ, පසුව වැඩි මිලට විකිනීමේ බලාපොරොත්තුවෙන් යපස් ඇනවුම් කරන්නේය යන චෝදනාව යටතේ කුඩා සමාගම් 20 කට වැඩි සංඛ්‍යාවකගේ බලපත්‍ර ආන්ඩුව විසින් අවලංගු කිරීමට යන බවය. එවන් තොග රැස්කිරීම් ''නිතර ම පාහේ නිශ්චිත භාන්ඩයක මිල පිම්බීමට හේතු වන අතර එම හේතුව නිසා කෘතිම ලෙස එහි ඉල්ලුම ඉහල නංවයි.'' පුවත් පත එසේ සඳහන් කලේය. ආන්තික සමපේක්ෂනයේ ප්‍රතිපලයක් ලෙස ගෝලීය භාන්ඩ මිල ගනන් ඉහල නැංවීමට තල්ලුව දෙමින් චීනය, සෑම මසකම සිය මූර්ත පරිභෝජනයට වඩා දෙගුනයක් තරම් වන, යපස් ටොන් මිලියන 50 ක් දැනට වැඩිපුර ආනයනය කරන බවට ගනන් බැලේ.

අල්ලස, දේශපාලන බලපෑම් හා දූෂනය මගින් සිය තරගකරුවන් අභිබවා වාසි ලැබීමේ අටියෙන් දැනට චීනය තුල ව්‍යාපාර කටයුතුවල යෙදෙන අන්තර්ජාතික සංගත විධායකයන් අතර, හියු ස්ටර්න් සිද්ධියෙන් කැලඹීමක් ඇතිකර තිබේ. බීජිනයේ පිහිටුවා ඇති උපදේශක සමාගමක් වන ඩ්‍රාගොනොමික්ස් හි විධායක අධ්‍යක්ෂ ආතර් ක්‍රොයිබර් ඒඑෆ්පී පුවත් සේවයට මෙසේ පැවසීය. ''ඔබ රාජ්‍ය ව්‍යවසායක් වෙතින් තොරතුරු රැගෙන කුමන හෝ විදේශ පාර්ශවයකට ඒවා ලබා දුනහොත්, චීන නීතිය අනුව රාජ්‍ය රහස් නීති උල්ලංඝනය කිරීමේ චෝදනාව ඔබට එරෙහිව නැගිය හැකිය.''

*නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ වචන වලට අනුව ''මහජන සම්බන්ධතා නින්දාවක'' තත්ත්වයක් තුල ''ආයෝජකයන් සසල කිරීමේ'' අනතුර පැවතියදී ම චීන නායකත්වය, නිෂ්පාදන කර්මාන්තය පදනම් කරගත් එහි ආර්ථිකයේ කොඳු නාරටිය වන වානේ කර්මාන්තය රැකගැනීමේ මංමුලාවෙන් පසුවෙති. ලන්ඩනය පදනම් කරගත් මැක්වයරි සමූහයේ වානේ විශ්ලේෂකයෙකු වන ජිම් ලෙනන් එම පුවත්පතට මෙසේ පැවසීය. ''චීන වානේ සමාගම් තරගයට නිරාවරනය වී ඇත.... ඔවුන්ට අවශ්‍යව ඇත්තේ සැපයුම ග්‍රහනයේ තබාගැනීමයි. එසේද වුවත්, පෙරනොවූ විරූ ආර්ථික පසුබෑම තුල වාර්ෂික පාදක මිල, එය මෙතෙක් ලඟාවී ඇති දෙවන ඉහලම මිල මට්ටම කරා පැමින තිබේ.''

රජය සතු චීන ඇලුමිනියම් සංස්ථාව (චිනල්කෝ) විසින් බිලියන 19.5 කට රියෝ මිලට ගැනීමේ පාර්ශවීය ගනුදෙනුව, යපස් මුල්කොටගත් බිලියන 116 ක ඒකාධිකාරී බද්ධ ව්‍යාපාරයක් බීඑච්පී සමඟ ගොඩනැගීම වෙනුවෙන්, රියෝ විසින් අතහැර දැමීමෙන් යන්තම් මසකට පසුව ස්ටර්න් හියු අත්අඩංගුවට ගැනීම සිදුවිය.

මෑත වසරවල ඉහල නඟින මිල ගනන් හමුවේ

චීනය අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ හා ඕස්ට්‍රේලියාවේ කැනීම් හා කාර්මික වත්කම් අත්කර ගැනීමේ උත්සාහයක නිරතව සිටියි. එහි ප්‍රතිපලය වශයෙන් චීන රජය, බලහත්කාරී මිල ඉහල දැමීම් පැටවීමේ යෙදී සිටින ගෝලීය කැනීම් සංගතයන් සමඟ තියුනු ගැටුමකට එලඹ සිටියි.

පසුගිය වසරේ චීන සමාගම් විසින් යපස් ඇනවුම් අවලංගු කිරීම හෝ ප්‍රමාද කිරීම වෙනුවෙන්, බිලියන 9 ක් වන්දි ඉල්ලා සිටීම මගින් රියෝ මෑතදී, ආතතීන් තවත් උත්සන්න කලේය. පසුගිය සතියේ දී ට්වෙන්ට් ෆස්ට් සෙන්චරි බිස්නස් හෙරල්ඩ් වාර්තා කලේ ජූනි මාසයෙන් පසුව රියෝ, ගිවිසුම් උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන්දි ඉල්ලා චීනයේ වානේ සමාගම් එකින් එක කරා ගොස් ඇති බවයි.

ඕස්ට්‍රේලියානු ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා බීජිනයට එරෙහිව නැඟී නොසිටීම පිලිබඳව අගමැති කෙවින් රඩ් ලිබරල් ජාතික විපාර්ශවයේ දැඩි විවේචනයට ලක්ව සිටිය දී පවා, ස්ටර්න් හියුගේ අත්අඩංගුවට ගැනීමට එරෙහිව ප්‍රසිද්ධියේ විරෝධය පල කිරීමට ඔහු මැලි කමක් දැක්වීය. බීජිනයට හිස නමන බව පෙනී නොයෑම සඳහා රඩ්, 14 දින වාර්තා කරුවන්ට ප්‍රකාශ කලේ ''ඕස්ට්‍රේලියානු පුරවැසියන් හොඳින් ජීවත් වීම'' චීනය සමඟ කරන දැවැන්ත ව්‍යාපාරික ගනුදෙනු වලට වඩා ප්‍රමුඛ වන බවයි.

ස්ටර්න් හියුගේ අත්අඩංගුවට ගැනීම මෑතදී පලකල කැන්බරාහි ආරක්ෂාව පිලිබඳ ධවල පත්‍රිකාව පිලිබඳ එකට එක කිරීමක් බවට ඕස්ට්‍රේලියානු මාධ්‍යවල සමපේක්ෂනයක් ද ගොඩනැඟී තිබේ. එ තුලින් අනතුරු අඟවා ඇත්තේ, එලඹෙන විසි වසර තුල ඕස්ට්‍රේලියාවේ හා අනෙකුත් එක්සත් ජනපද මිත්‍ර රටවල ආරක්ෂාවට චීනය තර්ජනයක් වියහැකි බවය. හිටපු අගමැති පෝල් කීටිං ද ඇතුලු පාලක පැලැන්තියේ කොටස්, ධවල පත්‍රිකාව විවේචනය කර ඇති අතර එහි ප්‍රවිෂ්ටය බීජිනය කෝපයට පත් කරනු ඇති බව ප්‍රකාශ කලහ.

ඕට්‍රේලියානු ධනවාදය චීනයට කරන ඛනිජ අපනයන මත දැඩි ලෙස රැඳී පවතියි. ගෝලීය ආර්ථික පසුබෑම එරටෙහි තියුනු සමාජ ගැටුම් මුදාහරිනු ඇතැයි කැන්බරාව තුල බියක් පවතියි. ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු හා වෙලඳ අමාත්‍යංශය විසින් සංචාරකයන්ට කල අලුත්ම අනතුරු ඇඟවීම පලකල වෙබ් අඩවිය මෙසේ සඳහන් කරයි. ''ඕස්ට්‍රේලියානුන් හා අනෙකුත් විදේශිකයන් මුහුන පාන සිද්ධීන් සංඛාවේ ඉහල යාමක් සිදුව තිබේ. නිතර ම පාහේ කම්හල් කලමනාකරුවන් ඔවුන්ගේ සේවා ස්ථානවල දී ඔවුන්ගේ කැමැත්තට එරෙහිව රඳවාගෙන තිබේ. මෙ සිදුවීම්වලට මැදිහත්ව ඇත්තේ අසතුටට පත් සේවකයන්ය. නිතරම පාහේ තර්ජන හා ප්‍රචන්ඩත්වය යොදාගන්නා විරෝධතා මගින් වැටුප් හා රැකියාවේ ගැටලු විසඳගැනීමට මොවුන් උත්සාහ දරයි.''

අනෙකුත් බටහිර නායකයන් මෙන් රඩ්, සින්ජියෑන්හි සිදුකල බීජිනයේ පොලිස්-රාජ්‍ය මර්දනය හෙලදුටුවේ නැත. එහි සිදුවූ ගැටුම් වනාහි, පසුගිය දශක දෙක තුල ලෝක ධනවාදය තිරසාර කිරීමෙහි ලා එතරම් ම වැදගත් භූමිකාවක් ඉටුකල, බීජිං තන්ත්‍රය විසින් පැටවූ ලාභ ශ්‍රම කොන්දේසි තුලින් කුලුගන්වන ලද පුලුල් සමාජ අතෘප්තියේ තවත් එක් පිලිබිඹුවක් විය.

© www.wsws.org